# Little Bit Advices to Young Girls…



Sathmini Thilakarathna

කෘතියේ නම - Little bit advices to young girls

කතෘගේ නම - Sathmini Thilakarathna

ISBN - 978-624-206-772-8

කතෘගේ වෙනත් කෘති - අත්භූත දූපත

අප්පච්චී නුඹයි

කෘතිය පළ කරන දිනය - 15/11/2023

# පිදුම

මාගේ පාසලේ ඉගෙනුම ලබන සියලුම සොහොයුරියන්ට ආදරයෙන් පුදමි!..

# පෙරවදන

වත්මත් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥා සම්පත්ත දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථ කරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩී පිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා පිවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ දිව්‍ය දිගන විද්‍යුත් පොතක් "වව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම ඉදිරි අධ්‍යාපනයට මෙම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරු හවතුන් දෙමාපියත් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම තන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධිර විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 11.01

ග ද්ද පිටිසර ගමක් වුන මාතර නගරය ඇතුලට වෙන්න තිබුනු,කෝන්ගල කියන්නේ කවුරුත් නොදන්න අප්‍රසිද්ධ ගමක්..මාර/කෝන්ගල මධ්‍ය මහා විදුහල කියන්නේ ඒ තරම් ප්‍රසිද්ධත්වයක් නොඉහිලූ පාසලක්..

"සුදූ දූව කාලා ඉන්න ළමයෝ.."

කල්පනා ලෝකයේ සැරිසරමින් හිටපු නුහාරා පියවි සිහියට ආවේ එයාගේ අම්මා කතාකරද්දීයි..

"මේ එනෝ.."

කොන්ඩෙ ගොතමින් හිටපු නුහාරා ගොතලා කොන්ඩෙ ඉතුරු වෙන අවසාන ටික නමලා රිබන් එකක් ගැටගහමින් ගියේ සාලෙට තමන්ගේ අම්මගෙන් බත් කටක් කන්න..

"දූව..සිහිනි දූව නැද්ද අද? වෙනදට මෙලහකටත් ඇවිල්ලා බතුත් කාලානෙ යන්නේ.."

"අද එයා නෑ අප්පච්චී..අම්මාව එක්කන් ක්ලිනික් එකට යන්න තියෙනවා කිව්වා.."

අම්මාගෙන් බත් කටකුත් කන ගමන් කටත් ඇද කරගෙන අප්පච්චිට එහෙම කිව්වේ නුහාරාට සිහිනි නැතුව පාලුවක් දැනුන නිසා..

"අද මාත් එක්ක යමු එහෙනම්..කන්තෝ්රුවට යන ගමන් දාගෙන යන්නම්.."

නුහාරාගේ අප්පච්චී තැපැල් කන්තෝරුවෙ වැඩට යන ගමන් මේ වගේ දවස්වලට ඉස්කෝලෙ ළඟින් නුහාරාව දාලා ගියේ බොහොම කලාතුරකින්..මොකද සිඟිති එන්නේ නැති වෙන්නේ ලෙඩක් දුකක් හැදුනොත් මිස නිකරුනේ නෙවෙයි..

"සුදු දුව ඉක්මනට යන්න..අප්පච්චිට පරක්කු වෙනවා.."

"හරි හරි මේ යනවා.."

නුහාරා අම්මට දන ගහලා වැඳලා කම්මුලකුත් ඉබගෙනම දුවන් ගියේ ඉස්තෝප්පුව ඉස්සරහට..

"නුහාරා උඹ මැත්ස් කලාද?"

"ඔව් කළා..ඇයි උඹ කලේ නැද්ද..?"

බුදුන් වැඳලා ඉවර වුන ගමන් ම දේදුනු නුහාරාගෙන් අහපු ප්‍රශ්නෙට නුහාරා උත්තර දුන්නේ හීනියට හිනා වෙන ගමන්..

"ආනේ මගේ රන් මැනික..පොත දියන්කෝ පටස් ගාලා කොප්පක් ගහගන්ඩ.."

"ආ ආ ගන්ඩ.."

නුහාරා දේදුනුට පොත දීලා විනාඩියක් යන්න නෑ,එකපාරටම පන්තියට කඩා පාත් වුනේ පන්තියේ මොනිටර්..

"ළමයි අහන්න අද ඉන්ටවල් එකෙන් පස්සේ 9,10,11 ළමයින්ට මොකක්දෝ වැඩසටහනක් තියෙනවා කිව්වා.. නා ගහ ගාවට හැමෝම කාලා ඉවරලා යන්න.."

දේදුනුට නම් ඒක සුබ ආරංචියක්.. මොකද ඉන්ටවල් එකෙන් පස්සෙ තිබුනෙ මැත්ස් පීරියඩ් එක..

"අඩෙහ් ඒ කියන්නේ අපිටත් තියෙනවද?"

සිතිජ එක පාරටම පන්තිය ඉස්සරහට පැනලා මොනිටර් වුනු අයෝද් ගෙන් අහද්දි,ඒ කියපු දෙය නම් සිතිජට ඇරෙන්න අනිත් හැමෝටම තේරුනා..

"නැනේ..අපි අයත් වෙන්නෙ නෑනේ..9,10,11 අයට විතරයි.."

"ඒම වෙන්ඩ බෑනේ බම්..අපි 11 නෙ.."

"අයියෝ උබට නම්,විහිලු තේරෙන් නැද්ද විහිලු.."

"ඕහ් යේ..මැත්ස් පීරියඩ් එක කට් වෙනවෝ..."

ළමයි හැමෝම බෙරිහන් දුන්නට නුහාරාට නම් ටිකක් දුකයි..මොකද එයාගේ කැමතිම විශය මැත්ස්..

ළමයි හැමෝම ඉන්ටවල් එකේ කෑම කාලා ගියේ නා ගහ ගාවට..පුටු තියලා ඉස්කෝලෙට තිබුනු එකම මයික් එකත් තියලා ලස්සනට එතන හදලා තිබුනා..

"ඒ පිටිපස්සට යමන්.."

පිරිමි ළමයිනුයි තව ගැහැනු ළමයි ටිකකුයි පිටිපස්සෙම ඉදගද්දි නුහාරායි දේදුනුයි තව ගැහැනු ළමයින් කීප දෙනෙක් ටිකක් මැද හරියට වෙන්න ඉදගත්තා..

"ආයුබෝවන් සියලුම සිසු සිසුවියන්ට..ගුරු මණ්ඩලයෙන්ද,දයාබර සිසු සිසුවියන්ගෙන්ද අවසරයි..යොවුන් වියට පා තබලා මේ දරුවන්ගේ මේ කාලය තුළ විවිධ වෙනස්කම් සිද්ද වෙනවා..ඉතිම් ගොඩාක් දරුවෝ මේ කාලයේදි නොමඟ යනවා..ඔයාලට මේ උගුල් වලින් බේරිලා ජීවිතේ ඉදිරියට යන්න පොඩි අත්වැලක් දෙන්න තමා අපි සූදානම් වෙන්නේ.."

ඉස්කෝලේ ප්‍රින්සිපල් කතා කරන්න ගද්දි ශිෂ්‍ය නායක නායිකාවන් කසු කුසු ඇසෙන පැති වල සිට සිසුන් නිශ්ශබ්ද කලා..

"ගෞරවයෙන් ආරාධනා කරනවා ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපති දිව්‍යා වීරසේකර මැතිණියට මේ දරුවන් අමතන ලෙසට..!"

ළමයින් අත්පුඩි ගසන ගමන් බැලුවේ කවුද මේ එන්නේ කියලා..ළමයින්ට ටිකක් ඈතින් පොලිස් නිල ඇඳුමින් සැරසිලා තවත් කොස්තාපල් වරියක් සමඟ ගාම්භීරව එන මේ කත දිහා සියලුම දෙනා ඇසිපිය නොහෙළා බලන් හිටියා..මැයව දැක්කාම කාටද නොහිතෙන්නේ තමන්ටත් මේ අයුරින් ඉන්න පුලුවන් නම් කියලා..

"ආයුබෝවන් දරුවනේ..අපේ ප්‍රින්සිපල් සර් ගෙනුත්,ගුරුවරුන්ගෙනුත්,දයාබර දරු දැරියන්ගෙනුත් අවසරයි..මාව දන්නවාද මේ ළමයි..ප්‍රින්සිපල් සර් කියන්න ඇතිනේ නේ.."

ඒ කටහඬට නම් මයික් ඕන වෙන්නේ නෑ..පොලීසියේ සිටිය යුත්තේ මෙවැනි නිලධාරින් තමා..

"ළමයිනේ ඔයාලගේ දෙවැනි අම්මා තමයි මන්..මොකද මේ ප්‍රදේශයේ ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපති මම..මට මේ ප්‍රදේශයේ ඉන්න ඔක්කෝම දරුවෝ මගේ දරුවෝ..පුතේ අද මන් කතා කරන්නෙ ඔයාලා වෙනුවෙන්..මේ කියන දේවල් හොඳට හිතට ගත්තොත් ජීවිතේ ගොඩයයි නැත්තම් මොන මඟුලක්ද මේ කියලා වීසි කරලා දැම්මොත් ජීවිතේ විනාස වෙයි..මට කියන්ඩකෝ දැන් උබලගේ බාහිර විනය නම් අවුලක් නෑ..අභ්‍යන්තර විනය තමයි අවුල්..ඕක තමයි අංක එක..බාහිර විනය කිව්වේ මොකක්ද?ඇඳුම් ටික ලස්සනට ඇඳලා කොන්ඩෙ ලස්සනට පීරලා සපත්තු ලස්සනට දාලා පිරිසිදුවට ඉන්න එක..ඒක ඉස්කෝලෙන් හදනවා..ඒක මං දන්නවා..හැබැයි කොයි දැන් අභ්‍යන්තර විනය..තැනට සුදුසු විදියට ඉන්න ඕනි ආචාර ධර් ම හොඳ ගතිගුණ හොඳ හැසිරීම මේවා ඔක්කෝම තමන් විසින්ම හදාගන්න ඕනි ඒවා..ඒක වෙන කාටවත් බලෙන් හදන්න බෑ..ඒක තමයි අභ්‍යන්තර විනය කියන්නේ..දැන් මං දන්නවා මෙතන ඉන්න බාගෙට බාගයකටම පෙම්වතුන් පෙම්වතියන් ඉන්නවා..එහෙම නේද?"

ළමයි ඔක්කොම හිනා වෙන්න ගත්තා..

"ඇයි දැන් හිනාවෙන්නේ..නැද්ද?ආහ් එහෙනම් මට වැරදිලා..හරි හරි..අහගන්නකෝ..මන් ළගට ආවා දවසක් අම්මා කෙනෙක් පැමිණිල්ලක් අරන්..මොකක්ද පැමිණිල්ල?දුව ක්ලාස් ගිහිම් තවම ආවේ නෑ..අපි ඉතින් මොකද කරේ හොයලා බැලුවා..බලද්දි..කෙල්ල ක්ලාස් එක ඇතුලට ගිහිම් අම්මා ගියයින් පස්සේ කොල්ලා එක්ක බීච් එකට ගිහිල්ලා..දන්නෙම නැතුව ඉතින් රෑත් වෙලා..කෙල්ලට වයස අවුරුදු 15 යි..කොල්ලට 20 යි..බාල වයස්

කාර දෙමාපිය යටතේ දියණියක් අපහරණය යටතේ කොල්ලව අනිවාර්යෙන්ම අත්තඩංගුවට ගන්න වෙනවා..මං පොඩ්ඩක් අත අල්ලගෙන හිටියා විතරයි..සත්තයි..කොල්ලා කියනවා..මට පුතේ පැමිණිල්ලක් දැම්මාම එහෙම නීතියට පටහැනි වෙන්න බෑ..ඔන්න කෙල්ලගේ අඩුම කොල්ලට දශමයක් හරි ආදරෙයි නම් උගෙන් කිස් එකක් වත් ගන්න එපා..උන්දැ ඉවරයි..හරිද..ඔය පිරිමි ළමයින්ට හෙනට ගෑනු ළමයි බූට් තියනවා නේ..මෙතනත් ඇති බූට් එහෙම කාපු අය..අහ් ඒකට කමක් නෑ..මේක ගෑනු ළමයින්ට විශේශයි.. කෙල්ලක් මැත්ස් කරන තමන්ගෙ කොල්ලට නිරුවත් පොටෝ යවනවා..අරු කියනවා මේ කෑල්ල එවන්න..මේ කෑල්ල එවන්න ගගා..ඇගේ කෑලි කෑලි ඉතින් පොටෝ ගහලා යවනවා..මේ හොඳ මොලයක් තියෙන කොල්ලා..ක්ලාස් එකේදි තමා දෙන්නා සෙට් වෙලා තියෙන්නේ..දැන් ඉතින් ඔන්න උසස්පෙළ කරලා ඔක්කොම ඉවර වෙලා දෙන්නා ඉතින් දෙපැත්තකට වෙලා..මාස ගානක් ගියාට පස්සේ කෙල්ලට එනවා කෝල් එකක් ‘මට රු.50000 දුන්නැතතම් තමුසෙගෙ අර පොටෝ දානවා සමාජ මාධ්‍යට’..කොල්ලා අර කෙල්ලගේ නිරුවත් පොටෝ එවලා තර්ජනය කරනවා..කෙල්ලට කොහෙන්ද ඉතින් සල්ලි..අම්මා උපන්දිනේට අරන් දීපු මුද්ද ගිහිම් උකස් කරලා සල්ලි දෙනවා..ඒත් හම්බෙන්නේ 25000 යි..ඉතින් අරු ඉල්ලපු ගාන නුදුන්න නිසා කෙල්ලව බය කරන්න මූන වහලා පොටෝ එකක් සමාජ ජාලයකට මුදාහරිනවා..කෙල්ල හොඳටම බය වෙලා මොනවද කරන්නෙ කියලා හිතාගන්ඩ බෑ..යනවා කෝච්චි පාරට..කෝච්චිය එනවා පෙනි පෙනී ගිහින් හිට ගන්නවා රේල්පාරේ..මේක දකිනවා එක අවුරුදු 20 ක විතර කොල්ලෙක්..පුදුමයි මං අදටත් ඒ කොල්ලට ගරු කරනවා පුදුම ගතිගුණ ඒවා..අර කෙල්ලවත් ඇදගෙන පයිනවා රේල්පාරෙන් එහාපැත්තට..දනිස්සෙන් පල්ලෙහා ගන්ඩ දෙයක් නෑ..පතුරු ගැහිලා..කෙල්ලවත් ඇදගෙන කොහොමහරි මේ කොල්ලා ආවා පොලීසියට..මං පැමිණිල්ල බාර අරගෙන කෙල්ලගෙන් එහෙම සිය දිවිනසාගන්න හේතු අහද්දි තමයි මට අර කතාව කිව්වෙ..අර කොල්ලට බෙහෙතුත් දාලා දීලා ස්තුති කරා..මාර කොල්ලෙක්..අර වැරදි වැඩ කරලා මැරෙන්න ගිය එකීව බේරගන්න ගිහින් ඒ කොල්ලටත් තුවාල වුනා..කෙල්ලගේ ජීවිතේ වරද්ද ගත්තොත් වැරදුනාම තමා..ආයේ නෝ චාන්ස්..වීදුරුවක් ඔයාලා..කැඩුනොත් හදන්න බෑ..කොල්ලො නම් වැරද්දක් කලොත් නාවලා ගෙට ගත්තහැකි නේ.. කොල්ලො ඉස්සරහ රෙදි නම් ගලවගන්ඩ එපා..තව දෙයක් ඔයාලට හිතෙනවා ඇති අරයා මන් දිහා බලනවා..මන් ලස්සනයි ඒ කියන්නේ..හම්මො..හෙන

ගැම්මක් එනවා නේ..මන් තමා පොර..ඔක්කොම බලනවා මන් දිහා..මට ඉන්නවා යක්කු වගේ අයියලා තුන්දෙනෙක්..ඒ හින්දා මං ක්ලාස් යන්නෙ එන්නෙ එයාලා එක්ක..හැබැයි දවසක් දැන් සර් පැයකට කලින් ක්ලාස් එක ඇරියා..මට හෙන සතුටුයි මොකද කවදාවත් යාලුවෝ එක්ක එන්ඩ හම්බෙන්නෙ නෑ..දැන් මන් ඉතින් යනවා පාරෙ කුඩේත් ඉහල ගෙන ටිකක් අව්වයි..යන යන හැමෝම මන් දිහා දැන් බලන් යනවා..මට හෙන හැපි දැන්..ටික වෙලාවක් ගිහිම් බලද්දි මන් යන්නේ කුඩේ හරියට ඉහලන් නැතිව කුඩේ මිට දික්කරලා අල්ලගෙන..මට විලිලැජ්ජාවේ බෑ..ඔක්කොම මන් දිහා බලලා තියෙන්නේ ඒකයි..මන් තමා මේ පොර වෙන්න හැදුවේ..හයියෝ ඉතින්.."

ළමයි හැමෝම බඩ අල්ලන් හිනාවෙනවා..නුහාරාටත් හිනාව පාලනය කරගන්න බෑ..ශිෂ්‍ය නායක නායිකාවන් ආයෙත් ළමයින්ව නිශ්ශබ්ද කලා...

"හරි අපි ඒ මාතෘකාව අතහරිමුකෝ..දුම්බීම,මත්ද්‍රව්‍ය පාවිච්චි කිරීම,මත්පැන් පානය..මොනදා අප්පේ ඒ..කොල්ලො විතරක් නෙවේ දැන් කෙල්ලොත් බොනවා..හනේ හප්පේ..මේ කෙල්ලෝ එහෙම නැතුව ඇති කියලා හිතනවා..ඇයි මේ ලංකාවේ ඔව්වා තහනම් නොකරන්නේ නේද..ගොඩාක් අය කරන්නේ ඉතින් ඕක කිය කිය රජයට බයින එක..දැන් කවුරුවත් ඕවා බලෙන් පොවනවද මිනිස්සුන්ට? නැනේ..තමන් විසින්මයි ඒක නවත්තන්න ඕනි..ඔව්වා ගන්න නිසානේ විකුනන්නේ..තම තමන් පාලනය වුනොත් රටම පාලනය කරන්න පුලුවන්..ඕවා බීලා තමන්ගෙ වකුගඩු නරක් කරගන්නවට වඩා හොද නැද්ද තියෙන දෙයක් කාලා පැත්තකට වෙලා ඉන්නවා..වකුගඩු නරක් වෙන එක කෙසේ වෙතත් ගොඩාක් පිරිමි ගංජා ගහලා,තූල් තියලා මත් වෙලා අසහනකාරයෝ බවට පත් වෙලා..ගෑනු ළමයෙක්ට බස් එකේ යන්ඩ බෑ..පාරක යන්ඩ බෑ..මං මේක අනිවාර්යෙන්ම කිව යුතුයි..අම්මෙක් වශයෙන්..එක දුවක් බස් එකේ හිරවෙලා,තෙරපිලා ඉස්කෝලෙ යනකොට එක අසහනකාරයෙක් ඒ කෙල්ලගෙ ඇඟට ශුක්‍රාණු පිට කරලා..ඉතින් ඒ දුව අඬලා..පැමිනිල්ලක් දැම්මා..මන් ඒ සාහසිකයාට දඬුවම දුන්නා..අම්මෙක් වශයෙන් මට එවෙලේ දැවුනේ පුදුම දුකක්..ඒ කෙල්ල එවෙලේ කොච්චර අසරණ වෙන්න ඇත්ද?ඉතින් ඔන්න මත්ද්‍රව්‍යවල ප්‍රතිඵල තව හෙන ගොඩක් තියෙනවා

පුතේ..ඒත් කාලවේලාවත් මදිනේ..ඔයාලව 1.15 ට යවන්නත් ඕනි..හරි අහන්නකෝ..ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය..මොකක්ද ඒ..ගෙදර අම්මගෙන් තාත්තගෙන් බලපෑම්ලඅම්මා තාත්තා රණ්ඩු වෙන එක මේ වගේ දේවල් නිසා දුවලා පුතාලා සමහරුන් මානසික පීඩාවෙන් පෙලෙනවා..මන් හිතනවා මෙතන එහෙම නැතුව ඇති කියලා..දුවේ,පුතේ ප්‍රශ්නයක් තියනවනම් බය නැතුව මට කියන්න අනිවාරෙන්ම මන් ඒකට සුදුසු පියවර ගන්නවා..පන්තිභාර ටීචර් ගෙන් ඉල්ලගන්න මගේ නම්බර් එක එයාලා ළඟ තියෙනවා..ඕනි වෙලාවක මන් ඉන්නවා ඔයාලත් එක්ක..පුතේ දුවේ තව දවසක එන්නම් ගොඩාක් වෙලා කතා කරන්න ඔයාලත් එක්ක...මට තියෙන වෙලාවත් ඉවරයි..ආයුබෝවන් දරුවනේ.."

"ආයුබෝවන් මැඩම්.."

හැමෝම ළමයි නැගිටලා ආචාර කලේ හදවතින්ම යි..

නුහාරා නම් හිතුවේ මේ මැඩම් දන්නවා නම් මේ ඉන්න සම හරක් මේ කනෙන් අහලා අනිත් කනෙන් පිට කරලා විහින් විනාශ වෙනවා කියලා..

කාටවත් බෑ කාවවත් හදන්න තමන් විසින්මයි හැදෙන්න ඕනි..ආදර්ශයක් ගැනීම ඔබ සතු බව මතක තබා ගන්න..

# නිමි..!

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතු කොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ඉන්ථ කරණයට යොමු කරන ක්‍රියාමූලික පරියේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර පොත්‍යාන්තර පාඨකයන් වෙත ලඟා වීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම දැනීම නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය නික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මන් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් පූජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ශක්තිය ලැබේවායි පතමු.. මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ගස්කතු අංකුර සබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023.11.01